# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1036/13 – 1998 ජූලි 16 වැනි බ්‍රහස්පතින්දා – 1998.07.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. – බී. 4/96. ඇමුණුම 1

### 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 30 වන වගන්තිය සමග කියවිය යුතු 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1998 ජූලි මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග, 1998 සජීවී මසුන් අපනයනය සහ ආනයනය කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. කිසිම තැනැත්තකු විසින් මෙහි උපලේඛනයේ I වන කොටසේ විස්තර කෙරෙන යම් සජීවී මත්ස්‍ය විශේෂයක් අපනයනය නොකළ යුතුය.
3. කිසිම තැනැත්තකු විසින් (මෙහි මින්මතු "අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ විසින් තත් කාර්යය සඳහා තමා වෙත නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක අධිකාරය යටතේ මිස මෙහි උපලේඛනයේ II වන කොටසේ දැක්වෙන සජීවී මත්ස්‍ය විශේෂයන් අපනයනය නොකළ යුතුය.
4. කිසිම තැනැත්තකු විසින් මෙහි උපලේඛනයේ III වන කොටසේ සඳහන් කෙරෙන සජීවී මත්ස්‍ය විශේෂයන් ආනයනය නොකළ යුතුය.
5. 3 වන නියෝගය යටතේ වූ අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම්පත්‍රයක්ම මෙහි උපලේඛනයේ IV වන කොටසේ දැක්වෙන "අ" ආකෘතිය අනුව අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ සමග රුපියල් එක්දහසක ගාස්තුවක් ද ඉදිරිපත් කළ යුතුය.
6. 5 වන නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම මෙහි උපලේඛනයේ IV වන කොටසේ දැක්වෙන "ආ" ආකෘතිය අනුව විය යුතු අතර එය කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු විය යුතුය. තවද ඒ අවසර පත්‍රය, එහි සඳහන් නියම හා කොන්දේසිවලට යටත් විය යුතුය.
7. 2 වන හා 3 වන නියෝගවල කුමක් සඳහන් වුව ද, තත් කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් අධිකාරය යටතේ ආනයනය කරන ලද සජීවී මසුන් යම් තැනැත්තකු විසින් අපනයනය කරනු ලැබිය හැකිය.
8. 7 වන නියෝගය යටතේ වූ අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අධ්‍යක්ෂ වෙත මෙහි උපලේඛනයේ IV වන කොටසේ දැක්වෙන "ඇ" ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතුය.
9. 8 වන නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම මෙහි උපලේඛනයේ IV වන කොටසේ දැක්වෙන "ඈ" ආකෘති පත්‍රය අනුව විය යුතු අතර එය එහි සඳහන් නියම හා කොන්දේසිවලට යටත් විය යුතුය.
10. කිසිම තැනැත්තකු විසින් අධ්‍යක්ෂ විසින් තත් කාර්යය සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් අධිකාරය යටතේ මිස, සජීවී මත්ස්‍ය බිත්තර, අන්ඩපාත හෝ මත්ස්‍ය පැටවි ආනයනය හෝ අපනයනය නොකළ යුතුය.


1A – PP013913 – 500 (2002/11)

11. 10 වන නියෝගය යටතේ වූ අවසර පත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම මෙහි උපලේඛනයේ IV වන කොටසේ දැක්වෙන "ඉ" ආකෘතිය අනුව විය යුතු අතර ඒ සමග රුපියල් එක් දහසක ගාස්තුවක් ද ඉදිරිපත් කළ යුතුය.

12. 11 වන නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම, මෙහි උපලේඛනයේ "ඊ" ආකෘතිය අනුව විය යුතු අතර එය එහි සඳහන් නියම හා කොන්දේසිවලට යටත් විය යුතුය.

13. 6 වන, 9 වන හෝ 12 වන නියෝග යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක සඳහන් නියම හා කොන්දේසි අවස්ථාවෝචිත පරිදි අපනයනකරුවකු හෝ ආනයනකරුවකු විසින් කඩ කර ඇති බව අධ්‍යක්ෂවරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් එම ආකෘති පත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය.

14. මේ නියෝගවල -

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා අදහස් වේ.

"අපනයනය" යන්නෙන් ශ්‍රී ලංකාවේ සීමාවලින් පිටත සමුද්‍රයට හෝ විදේශයකට ගෙනයාම අදහස් වේ;

"මසුන්" යන්නෙන් මත්ස්‍ය ගනයට අයත් වන හෝ අයත් නොවන කවර වුව ද ජලජ ජීවියකු අදහස් වන අතර ඊට කවර හෝ වර්ණයේ කවු මසුන්, පොතු මසුන්, කොරල්, මැද්දැෆි, වාලයිකයින්, හොලොතූරියාවන්, කොඳුඇට සහිත සත්ව විශේෂ, භූ ජලධාරී සතුන්, ජලජ ක්ෂීරපායින් සහ එවැනි ජීවීන්ගේ පැටව්, බිත්තර සහ පෙත විශේෂ ඇතුළත් වේ.

"ආනයනය" යන්නෙන් ශ්‍රී ලංකාවේ සීමා වලින් පිටත හෝ ඉන් ඔබ්බෙන් පිහිටි යම් ස්ථානයකින්, මුහුදින් හෝ ගුවනින් ශ්‍රී ලංකාව තුළට ගෙන ඒම අදහස් වේ.

( 2 වන නියෝගය)

## උපලේඛනය

### *I වන කොටස*

### සජීවී ලෙසින් අපනයනය තහනම් කර ඇති මත්ස්‍ය විශේෂ ලේඛනය

**සමුද්‍රික මසුන් :**

කුලය - කිටොඩොන්ටිඩේ
*කිටොඩොන් සිම්යොන්* බ්ලීකර්, 1855

කුලය - පොමකැන්තිඩේ
*සෙන්ට්‍රෝපිගේ බිස්පිනෝසස්* (ගන්තර්, 1860)
*පයිගොප්ලයිටෙස් ඩයිකැන්තස්* (බොඩාර්ට් 1772)

කුලය - ලැබ්‍රිඩේ
*කොරිස් ඇගියුලා* ලැසිපිඩේ, 1801
*ලැබ්‍රොයිඩෙස් බයිකලර්* ෆවුලර් සහ බීන් 1928

කුලය - ස්කෝපිනිඩේ
*ටෙරොයිස් රේඩියාටා* කුවියර්, 1829

කුලය - එපිපිඩේ
*ප්ලැටැක්ස් පිනාටස්* (ලිනේයස්, 1758)

කුලය - සෙරනිඩේ
*එපිනොපෙලස් ලැන්සියොලාටුස්* (බ්ලොච්, 1790)
*එපිනොපෙලස් ප්ලැටොසෙරුලියුස්* (ලැසිපිඩේ, 1802)

කුලය - හිමියුලිඩේ
*ජලෙක්ටොරින්කස් ඔබ්ස්කියුරුම්*
*ජලෙක්ටොරින්කස් ඇල්බොවිටාටුස්* (රපෙල්, 1835)

කුලය - පොමසෙන්ට්‍රිඩේ
*ක්‍රිසිප්ටෙරා කුයිටෙර්* ඇලන් සහ රාජසූරිය, 1995

*මිරිදිය මසුන්:*

කුලය – සිප්‍රිනිඩේ
*ලේබියෝ ෆිෂෙරි ජෝර්දාන් සහ ස්ටාර්ක්ස්, 1917*
*ලේබියෝ පොර්සෙලස් (හෙකල්, 1838)*
*පන්ටියස් අශෝකා කොටලව් සහ පෙතියගොඩ, 1989*
*පන්ටියස් මාර්ටෙන්ස්ටයිනි කොටෙලව් සහ පෙතියගොඩ, 1991*
*පන්ටියස් ශ්‍රීලංකෙන්සිස් (සේනානායක, 1985)*
*පන්ටියස් බන්දුල කොටෙලව් සහ පෙතියගොඩ, 1991*
*රාස්බෝරා විල්පිට කොටෙලව් සහ පෙතියගොඩ, 1991*
*මල්පුලුට්ටා ක්‍රෙට්ෂෙරි දැරණියගල, 1937*

කුලය – ගෝබිඩේ
*සිස්මැටොගෝබියස් දැරණියගල කොටෙලව් සහ පෙතියගොඩ, 1989*
*සිසිඔප්ටෙරස් හේලෙයි (ඩේ, 1888)*
*සිසිඔපස් ජොන්ක්ලාසි ක්ලාවුසේවිට්ස් සහ හෙන්රික්, 1986*
*වනා ඔරියන්ටාලිස් බ්ලොච් හා ෂෙනෙයිඩර්, 1801*

කුලය – කොබිටිඩේ
*ලෙපිඩොසෙපලිකතයිස් ජොන්ක්ලාසි දැරණියගල, 1956*

වන නියෝගය)

## *II වන කොටස*

### සජීවී ලෙසින් අපනයනය සීමා කරන ලද මත්ස්‍ය විශේෂ ලේඛනය

*සමුද්‍රික මසුන්:*

කුලය – කිටොඩොන්ටිඩේ
*කිටොඩොන් ඔප්ටොෆසියේටස් බ්ලොච්, 1787*
*කිටොඩොන් ඔනාටිසිමස් කුවියර්, 1831*
*කිටොඩොන් ෆැල්කියුලා බ්ලොච්, 1793*
*කිටොඩොන් සැන්තොසෙෆාලස් බෙනට්, 1832*
*කිටොඩොන් එෆිපියම් කුවියර්, 1831*
*කිටොඩොන් ශූනිමැකියුලේටස් බ්ලොච්, 1787*
*කිටොඩොන් මැඩගැස්කැරියෙන්සිස් ආහල්, 1923*
*කිටොඩොන් බෙනෙට් කුවියර්, 1831*
*කිටොඩොන් මෙයෙරි බ්ලොච් සහ ෂෙනයිඩර්, 1801*
*කිටොඩොන් ට්‍රයිඇන්ගියුලම් කුවියර්, 1831*
*හෙනිඕචස් මොනොසෙරස් (කුවියර්, 1831)*
*හෙනිඕචස් ප්ලියුරොටීනියා (කුවියර්, 1831)*

කුලය – පොමකැන්තිඩේ
*සෙන්ට්‍රොපියජ් ෆලැවිපෙන්ටොරාලිස් (රැන්ඩෝල් සහ ක්ලාව්සෙවිට්ස්, 1977)*

කුලය – බැලිස්ටිඩේ
*බැලිස්ටොයිඩෙස් කොන්ස්පිසිලම් (බ්ලොච් සහ ෂෙනයිඩර්, 1801)*
*සියුඩොබැලිස්ටස් ෆස්කස් (බ්ලොච් සහ ෂෙනයිඩර්, 1801)*

කුලය – සෙරනිඩේ
*වැරියෝලා ලූටි (ෆෝර්ස්කාල්, 1775)*
*වැරියෝලා ඇල්බිමාජිනේටා (බයිසැක්, 1952)*

*මිරිදිය මසුන්:*

කුලය – සිප්‍රිනිඩේ
*ඩැනියෝ පතිරණ කොටෙලාව් සහ පෙතියාගොඩ*
*පන්ටියස් කුමිංගි (ගුන්තර්, 1868)*
*පන්ටියස් නයිග්‍රොෆසියේටස් (ගුන්තර්, 1868)*
*පන්ටියස් තිත්තයා දැරණියගල, 1930*
*රාස්බෝරා වෙටරිෆලොරිස් දැරණියගල, 1930*

කුලය – ක්ලැරිඩේ
*ක්ලාරියස් බ්‍රැකිසෝමා ගුන්තර්, 1864*

කුලය – බෙලොන්ටිඩේ
*බෙලොන්ටියා සිග්නාටා (ගුන්තර්, 1861)*

කුලය – මාස්ටසෙම්බෙලිඩේ
*මැක්රොගන්තස් ආරල් ලෙසිපිඩේ, 1803*

(4 වන නියෝගය)

## *III වන කොටස*

### සජීවී ලෙසින් ආනයනය තහනම් කරන ලද මත්ස්‍ය විශේෂ ලේඛනය

*මිරිදිය මසුන් :*

කුලය – ඉක්ටාලූරිඩේ
*ඉක්ටලූරස් පන්ක්ටාටස්*
*ඉක්ටලූරස් ෆෝකාටස්*
*ඉක්ටලූරස් කාටස්*
*ඉටලරස් නෙබුලෝසස්*
*පැව්ලොඩික්ටිස් ඔලිවේරිස්*

කුලය – කැරසිඩේ
*සෙරසැල්මස් නැටෙරෙරි*
*සෙරසැල්මස් හොලන්ඩි*
*සෙරසැල්මස් අයිගෙන්මනි*
*සෙරසැල්මස් නොටාටුස්*
*සෙරසැල්මස් ස්ට්‍රියොලාටුස්*
*සෙරසැල්මස් ඉලන්ගෙටුස්*
*සෙරසැල්මස් ගිබුස්*
*සෙරසැල්මස් සැන්චෙසි*
*සෙරසැල්මස් ස්පයිලොප්ලියුරා*
*සෙරසැල්මස් ඇන්ටොනි*
*සෙරසැල්මස් රොම්බියුස්*
*සෙරසැල්මස් සෙරුලාටුස්*
*කැටොප්‍රියන් මෙන්ටෝ*

(5 වන නියෝගය)

## *IV වන කොටස*

*"අ" ආකෘතිය*

### සජීවී මසුන් අපනයනය සඳහා ඉල්ලුම් පත්‍රය

(මෙම ඉල්ලුම්පත්‍රය සමඟ රුපියල් එක් දහසක ගාස්තුවක් ඉදිරිපත් කළ යුතුය.)

1. ඉල්ලුම්කරුගේ / ආයතනයේ සම්පූර්ණ නම : ————————.
2. ලිපිනය : ————————.
3. දුර ඇමතුම් අංකය : ————————.
4. ෆැක්ස් අංකය : ————————.
5. සජීවී මත්ස්‍ය විශේෂවල නම් සහ ප්‍රමාණය : ————————.

| *මත්ස්‍ය විශේෂය* | *ප්‍රමාණය* | *අල්ලාගත් ප්‍රදේශය* |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |

6. ඉල්ලුම්කරු විසින් සජීවී මත්ස්‍ය විශේෂය අපනයනය කිරීමට අදහස් කරනුයේ කුමන රටක් වෙත ද : ————————.

7. පසුගිය මාස හය සඳහා මසුන්, මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් අපනයනය කිරීම පිළිබඳ මාසික ප්‍රකාශනය:

| මාසය | මත්ස්‍ය විශේෂය | අපනයනය කළ මෙරට ඇස්කළ සජීවී මසුන්, මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් ප්‍රමාණය | අපනයනය කළ මෙරටෙහි වගා කළ සජීවී මසුන් මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් ප්‍රමාණය | ආනයනය කරන ලද නැවත අපනයනය කළ මසුන් ප්‍රමාණය |
|---|---|---|---|---|
| .............. | .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. | .............. |

මෙහි පහත අත්සන් කරනු ලබන මම/අපි මෙහි සඳහන් කරන ලද සියලු විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි/කරමු මෙහි සටහන් කිරීමට නියමිත වූ විස්තර සාවද්‍ය ලෙස ප්‍රකාශ වී ඇත්නම්, එවැනි විස්තර සැපයීම මත නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු වීමට ඉඩ ඇති බවට මම/අපි එකඟ වෙමි/වෙමු.

..............................
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය: ..............................

(6 වන නියෝගය)

"ආ" ආකෘතිය

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

### සජීවී මසුන් අපනයනය කිරීම සඳහා අවසර පත්‍රය

.............................................. හි පදිංචි .............................................. යන අයට පහත දැක්වෙන සජීවී මත්ස්‍ය විශේෂ අපනයනය කිරීමට මෙයින් අවසරය දෙමි.

1.

| මත්ස්‍ය විශේෂ | ප්‍රමාණය | මත්ස්‍ය විශේෂ | ප්‍රමාණය |
|---|---|---|---|
| .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. |
| .............. | .............. | .............. | .............. |

2. මෙම බලපත්‍රය, කලින් අවලංගු කොට නොමැති නම්, .............................................. දින දක්වා වලංගු වේ.

3. මෙම බලපත්‍රය පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත් වනු ඇත.

   (i) මෙම බලපත්‍රය මෙහි නම සඳහන් අයිතිකරුට පෞද්ගලික වන අතර එය අන් අයකුට මාරු කළ නොහැකිය.

   (ii) ..............................

   (iii) ..............................

..............................
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ.

දිනය: ..............................

(8 වන නියෝගය)

"ඇ" ආකෘතිය

## ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සජීවි මසුන් අපනයනය කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම්කරුගේ/ආයතනයේ නම: ......
2. ලිපිනය: ......
3. දුර ඇමතුම් අංකය: ......
4. ෆැක්ස් අංකය: ......
5. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය: ......
6. මත්ස්‍ය විශේෂවල නම් සහ විස්තර:

| *මත්ස්‍ය විශේෂ* | *ආනයනය කළ ප්‍රමාණය* | *ආනයනය කළ දිනය* | *මුල් රට* |
|---|---|---|---|
| ...... | ...... | ...... | ...... |
| ...... | ...... | ...... | ...... |
| ...... | ...... | ...... | ...... |
| ...... | ...... | ...... | ...... |
| ...... | ...... | ...... | ...... |
| ...... | ...... | ...... | ...... |
| ...... | ...... | ...... | ...... |

| *අපනයනයේ ප්‍රමාණය* | *අපනයනය කිරීමට අපේක්ෂිත දිනය* | *අමුණා ඇති ලේඛන* |
|---|---|---|
| ...... | ...... | ...... |
| ...... | ...... | ...... |
| ...... | ...... | ...... |

7. ඉල්ලුම්කරු විසින් සජීවි මසුන් අපනයනය කිරීමට අදහස් කරන රටවල නම්: ......

මෙහි පහත අත්සන් කරනු ලබන මම/අපි මෙහි සඳහන් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි/කරමු.. මෙහි සඳහන් කළ යුතු වූ විස්තර සාවද්‍ය ලෙස ප්‍රකාශ වී ඇත්නම්, එවැනි විස්තර සැපයීම මත නිකුත් කරන ලද අවසර පත්‍රය අවලංගු වීමට ඉඩ ඇති බවට මම/අපි මින් එකඟ වෙමි/ වෙමු.

......
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය: ......

(9 වන නියෝගය)

"ඇ" ආකෘතිය

## ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
### ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද සජීවි මසුන් අපනයනය කිරීම සඳහා අවසර පත්‍රය

...... හි පදිංචි ...... යන අයට, ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පහත සඳහන් මසුන් වර්ග අපනයනය කිරීමට මෙයින් අවසරය දෙමි.

1.

| *මසුන් වර්ගය* | *ප්‍රමාණය* |
|---|---|
| ...... | ...... |
| ...... | ...... |
| ...... | ...... |
| ...... | ...... |
| ...... | ...... |
| ...... | ...... |
| ...... | ...... |

2. මෙම අවසර පත්‍රය කලින් අවලංගු නොකරන ලද නම් ...... දින දක්වා වලංගු වේ.
3. මෙම අවසර පත්‍රය පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත් වේ:
   (i) මෙම බලපත්‍රය මෙහි නම සඳහන් හිමිකරුට පෞද්ගලික වන අතර එය අන් අයකුට මාරු කළ නොහැකිය.
   (ii) ......
   (iii) ......

......
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ.

දිනය: ......

(11 වන නියෝගය)

"ඉ" ආකෘතිය

### මත්ස්‍ය බිත්තර . අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් ආනයනය/අපනයනය* කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

(මෙම ඉල්ලුම් පත්‍රය සමග රුපියල් එක් දහසක ගාස්තුවක් ඉදිරිපත් කළ යුතුය.)

1. ඉල්ලුම්කරුගේ / ආයතනයේ නම : ..............................
2. ලිපිනය : ..............................
3. දුර ඇමතුම් අංකය : ..............................
4. ෆැක්ස් අංකය : ..............................
5. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය : ..............................
6. මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් වර්ගවල නම් සහ ප්‍රමාණයන් :

| *මසුන් වර්ගය* | *බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් ප්‍රමාණය* |
|---|---|
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |

7. ඉල්ලුම්කරු විසින් සජීවි මසුන් අපනයනය/ ආනයනය* කිරීමට අදහස් කරනු ලබන රටවල නම් ..............................

මෙහි පහතින් අත්සන් කරන මම/අපි මෙහි දක්වා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි/කරමු. මෙහි සඳහන් කිරීමට නියමිත වූ විස්තර සාවද්‍ය ලෙස ප්‍රකාශ වී ඇත්නම්, එවැනි විස්තර සැපයීම මත නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු වීමට ඉඩ ඇති බවට මම / අපි මින් එකඟ වෙමි / වෙමු.

..............................

ඉල්ලුම්කරුගේ අත්සන

දිනය : ..............................

*නොගැලපෙන වචනය කපා දමන්න.

(12 වන නියෝගය)

"ඊ" ආකෘතිය

### ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

### මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් ආනයනය/අපනයනය* කිරීම සඳහා අවසර පත්‍රය

.............................. හි පදිංචි .............................. .............................. යන අයට, පහත සඳහන් වර්ගවල මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් අපනයනය / ආනයනය* කිරීම සඳහා මෙයින් අවසර දෙමි.

1.

| *මසුන් වර්ග* | *මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් ප්‍රමාණය* |
|---|---|
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |
| .............................. | .............................. |

2. මෙම අවසර පත්‍රය කලින් අවලංගු කර නොමැති නම්, .............................. දක්වා වලංගු වේ.
   (i). මෙම බලපත්‍රය, මෙහි නම සඳහන් හිමිකරුට පෞද්ගලික වන අතර, මෙය අන් අයෙකුට මාරු කළ නොහැක.
   (ii). අපනයනය කරන මත්ස්‍ය බිත්තර, අණ්ඩපාත හෝ මත්ස්‍ය පැටව් මේ අවසර පත්‍රයේ සඳහන් මත්ස්‍ය විශේෂ වලට සීමාවේ.
   (iii). ..............................

..............................

ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ

දිනය ..............................

*නොගැලපෙන වචනය කපා දමන්න.

(ඇමුණුම 1)

එල්. ඩී. බී. 4/96

## 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝග.

මහින්ද රාජපක්ෂ
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය.

1998 ජුලි මස 16 වන දින.
කොළඹ දී ය.

## නියෝග

1. මේ නියෝග 1998 මත්ස්‍ය පිරිසැකසුම් ආයතන නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු අධ්‍යක්ෂවරයා යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා විසින් තත්කාර්යය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තෙකු විසින් මත්ස්‍ය පිරිසැකසුම් ආයතනයක් පවත්වා ගෙන නොයායුතුය.

3. 2 වන නියෝගය දැක්වෙන බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'අ' ආකෘති පත්‍රය අනුව රුපියල් එක්දහසක ගාස්තුවක් ද සමග අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළයුතු අතර, 1984 අංක 6 දරන පනතින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ඒ ආයතනය වෙත නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය ඒ සමග ඉදිරිපත් කළ යුතුය.

4. 3 වන නියෝගය යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙහි උපලේඛනයේ දැක්වෙන 'ආ' ආකෘතිය අනුව විය යුතු අතර එය කලින් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු නොලැබුවහොත් මිස නිකුත් කළ දින සිට එක් වසරක කාලයක් සඳහා වලංගු විය යුතුය. තවද, ඒ බලපත්‍රය එහි සඳහන් නියම හා කොන්දේසි වලට යටත් විය යුතුය.

5. අධ්‍යක්ෂවරයා විසින්, 4 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් -
   (අ) ඒ බලපත්‍රයේ යම් නියමයක් හා කොන්දේසියක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කරන ලද බවට; හෝ
   (ආ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ඒ බලපත්‍රලාභියා වෙත නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය අවලංගු කර ඇති බවට සෑහීමට පත්වුවහොත් ඒ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකිය.

6. 1997 අප්‍රේල් මස 25 වන දින හා අංක 972/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පරිච්ඡින්න කරනු ලැබේ.

7. මේ නියෝග වල-
"මත්ස්‍ය පිරිසැකසුම් ආයතනය" යන්නෙන්, මසුන් පිළියෙල කරනු ලබන, සකසනු ලබන, ඇසුරුම් කරනු ලබන, අධිශීත කරනු ලබන හෝ ගබඩා කරනු ලබන ස්ථානයක් අදහස්වේ.

(3 වන නියෝගය)

## උපලේඛනය

*"අ" ආකෘතිය*

### මත්ස්‍ය පිරිසැකසුම් ආයතනයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලුම් පත්‍රය

1. ඉල්ලුම්කරුගේ නම : ..............................
2. ලිපිනය : .............................................. දුරකථන/ෆැක්ස් අංකය : ..............................................
3. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය : ..............................
4. මත්ස්‍ය පිරිසැකසුම් ආයතනය පිහිටි ස්ථානය : ..............................................
5. පිරිසැකසුම් කරනු ලබන මත්ස්‍ය වර්ගය හා පිරිසැකසුම් ක්‍රමය : ..............................

| *මත්ස්‍ය වර්ගය* | *පිරිසැකසීමේ ක්‍රමය* |
| --- | --- |
| | |

6. වාර්ෂික මුළු ධාරිතාව : ....................
7. එක් එක් මත්ස්‍ය වර්ගය පිළිබඳ අමුද්‍රව්‍ය ලබාගන්නා මාර්ගය : ..................
8. එක් එක් මත්ස්‍ය වර්ගය සම්බන්ධයෙන් නිමි නිෂ්පාදිත සඳහා ඉලක්ක කොට ඇති වෙළඳ පොළ : ..................
9. කාර්ය මණ්ඩල :

| වර්ගය | සේවයෙහි යොදවා ඇති සේවක ප්‍රමාණය |
|---|---|
| | |

10. අදාළ වෙනත් තොරතුරු : ..................

මා විසින් ඉහත සඳහන් කරන ලද කරුණු සත්‍ය හා නිවැරදි බව මම සහතික කරමි. මා විසින් මෙහි සඳහන් කොට ඇති තොරතුරු අසත්‍ය හෝ සාවද්‍ය බව හෙළිදරව් වුවහොත් මාගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කළ හැකි බවට සහ බලපත්‍රය නිකුත් කර ඇත්තේ නම් එය අවලංගු කරනු ලැබිය හැකි බවටද මම එකඟ වෙමි.

.......................................
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය..............................

(4 වන නියෝගය)

' ආ ' ආකෘතිය

මත්ස්‍ය පිරිසැකසුම් ආයතනයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය

බලපත්‍ර අංකය ..................

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ .................................................යන ස්ථානයේ, මෙහි පහත සඳහන් නියම හා කොන්දේසිවලට යටත්ව, මත්ස්‍ය පිරිසැකසුම් ආයතනයක් මෙහෙයවීම සඳහා ..................................................ස්ථානයේ පදිංචි ...................................................යන අයට මෙයින් බලය දෙනු ලැබේ.

1. මේ බලපත්‍රය කලින් අවලංගු කරනු නොලැබුවහොත්, නිකුත් කළ දින සිට එක් වසරක් සඳහා වලංගු වේ.

2. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරනු ලැබුවා වූ ලියාපදිංචි සහතිකය වලංගු කිරීම හේතු කොටගෙන මේ බලපත්‍රය අවලංගු වනු ඇත.

3. මේ බලපත්‍රලාභියා විසින් ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂකවරයා විසින් බලය දෙනු ලැබූ නිලධාරියකුට හෝ වෙනත් අයකුට පරීක්ෂණ කටයුතු සඳහා මත්ස්‍ය පිරිසැකසුම් ආයතනයේ පරිශ්‍රයට ඇතුල්වීමට ඉඩ සැලසිය යුතුය.

...................................
ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ.

දිනය : .........

07 – 678/2

2 – PP013913 ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.